2015 ඔක්තෝබර් මස 27 වැනිදා අඟහරුවාදා | දිවයින

# වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට මුදල් ඇමැතිගෙන් කොළ එළි

අජිත් අලහකෝන්

මෙවර අයවැයට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉදිරිපත් කළ යෝජනා සඳහා මුදල් ඇමැති රවි කරුණානායක මහතා විසින් යහපත් ප්‍රතිචාර දැක් වූ බව එම සංගමයේ ලේකම් වෛද්‍ය නලින්ද හේරත් මහතා 'දිවයින'ට ඊයේ (26 දා) පැවැසීය.

අයවැය සඳහා තම යෝජනා ඉදිරිපත් කිරීමට ඊයේ (26 දා) මුදල් ඇමැතිවරයා සමඟ සාකච්ඡාවක් පැවැත් වූ බවද වෛද්‍ය හේරත් මහතා පැවැසීය.

ජාතික වැටුප් ප්‍රතිපත්තිය අනුව සියලු රජයේ සේවකයන්ට මූලික වැටුප් වැඩිවීමක් ලබා දීම, වැටුප් අනුපාතය 1:12 දක්වා ගෙන යෑම යන කරුණු ඇතුළු යෝජනා කිහිපයක් මුදල් ඇමැතිවරයාට ඉදිරිපත් කළ බවද වෛද්‍ය නලින් ද හේරත් මහතා පැවැසීය.

රවි කරුණානායක මහතා සිය යෝජනා කෙරෙහි යහපත් ප්‍රතිචාර දැක් වූ බවද දෙපාර්ශ්වය අතර පැවැති සාකච්ඡා සාර්ථකව නිමාවූ බවද හේරත් මහතා පැවැසීය.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය, උප ලේකම් වෛද්‍ය නවීන්ද සොයිසා යන මහත්වරු ද, සංගමයේ උප ලේකම්වරුන් දෙදෙනාද සමඟ තමන් මෙම සාකච්ඡාවට සහභාගි වූ බවද වෛද්‍ය නලින්ද හේරත් මහතා පැවැසීය.